# මල්මිගේ සමනල ගවුම



ඔමන්සා කෙමිදිනී හඳපාන්ගොඩ

# මල්මිගේ සමනල ගවුම

කතාව සහ චිත්‍ර

## ඔමන්සා කෙමිදිනී හඳපාන්ගොඩ

හේමමාලි බාලිකා විද්‍යාලය

මහනුවර

**5 ශ්‍රේණිය C**

**2025/02/08**

**ISBN: 978-624-208-211-0**

# පිදුම

මාගේ හේමමාලී ගුරු මෑණිවරුන්ට සහ පියවරුන්ටත්

මාගේ ආදරණීය අම්මාටත් අප්පච්චිටත්

මා ළඟින්ම සිටින අත්තම්මලා දෙදෙනාට සහ සීයාටත්

කතන්දර පොතක් ලිවීම සඳහා මා ධෛර්යමත් කළ චතු පුංචිටත්

ආදරයෙන් පුදමි.......

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණිය යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට යේ අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කරමෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන්වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නෝ අනුමානය.

**විදුහල්පතිනිය,**

**ශශිකලා සේනාධිර,**

**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**



එකෝමත් එක කාලෙක හිටියා මල්මී කියලා පුංචි ගැහැණු ළමයෙක්.

එයා හරිම දුප්පත්.

මල්මී එක දවසක් යහළුවොත් එක්ක සෙල්ලම් කරන්න ගියා.

ඉතින් එයා යහළුවොත් එක්ක සෙල්ලම් කරනකොට එයාගේ ගවුම කෝටුවක පැටලිලා ඉරිලා ගියා.

ඉතින් මල්මීට හරිම ලැජ්ජා හිතුනා. ඉරුණු ගවුම දැකලා යහළුවෝ හොඳටම හිනාවුනා.




මල්මී ඉක්මනට දුවලා ගෙදරට ගියා.
දැන් ඉතින් පුංචි මල්මී උදේ ඉඳන් රෑ වෙනකම්
හිතන්නේ තමන්ට සිද්ධ වුන දේ ගැනමයි.

ඉතිං මල්මී එයාගේ අම්මගෙන් මෙහෙම ඇහුවා
"අම්මේ ඔයාගාව මට ගවුමක් ගන්න සල්ලි නැද්ද?"
අම්මා මෙහෙම කිව්වා. "අනේ මන් ගාව එච්චර සල්ලි නැහැනේ".
ඉතින් එයා එයාගේ තාත්තා ළඟටත් ගිහිල්ලා ඇහුවා, මට අලුත් ගවුමක් අරන් දෙන්න බැරිද කියලා.

තාත්තා කිව්වෙත් අම්මා කිව්ව දේමයි.

මල්මිට ගොඩක් දුක හිතුණා.

මල්මී එයාගේ ගෙදර ළඟ තියෙන
ඇළ ගාවට ගිහිල්ලා හොඳටම ඇඬුවා.





එකපාරටම සමනල්ලු රෑනක් ඇවිල්ලා
මල්මිගෙ ගවුමේ වැහුවා.
එයාලා ඉරුණු තැන හදලා
මල්මීගේ ඇඳුමේ වහලා හිටියා.

බලන්න දැන් මල්මිගෙ ඇඳුමේ ලස්සන.

මල්මිට හරිම සතුටුයි.



මල්මි යහළුවන්ට එයාගේ ගවුම පෙන්නුවා.





යහළුවන් මල්මිගෙන් ඇහුවා.

කොහෙන්ද ගවුම හම්බවුණේ කියලා.

එයා යහළුවන්ට විස්තරය ඔක්කොම කිව්වා.




යහළුවන් ඇළ ළඟට ගිහින් අඬන්න පටන් ගත්තා.

ඒත් කවුරුත්ම ආවේ නැහැ.

එක පාරටම පුංචි සමනලයෙක් ඇවිත් මෙහෙම කිව්වා.

ඔයාලා පුංචි මල්මිට ගොඩාක් විහිළු තහළු කළා.

ඒක නිසා අපි ඔයාලට මොකුත්ම දෙන්නේ නැහැ.

සමනලයා එහෙම කියලා එතනින් යන්න ගියා.



යහළුවෝ මල්මීව වට කරගෙන සමාව ගත්තා.

එයාලා ඊට පස්සෙ සතුටින් සෙල්ලම් කළා.



නිමි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා තේ කොටගත් අනාගත පරපුරේ හැකියාවන් සහ ඔප් නැන්වීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැක. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමගම දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසී පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක**

**සෙනවිරත්න මහලේකම්**

**ISBN: 978-624-208-211-0**